# එජාප හා ශ්‍රී ලනිප

පසුගිය සතියේ එක්සත් ජාතික පක්ෂයට අවුරුදු හැටක්ද, ශ්‍රී. ල. නි. පක්ෂයට අවුරුදු පනස්පහක්ද පිරීම නිමිත්තෙන් උත්සව පැවැත්විණි. 1948 න් පසුව මෙරට පාලනය කෙරී ඇත්තේ මේ පක්ෂ දෙකේ ප්‍රධානත්වයෙන් පැවති ආණ්ඩුවලින්ය. ඒ පක්ෂ දෙක ඇතැම් විටෙක සිංහල පකෂ ලෙසද, දකුණේ පකෂ ලෙසද හැඳින්වෙයි. ඒ අර්ථකථන නිවැරදි නොවනවා පමණක් නොව වැරදි නිගමනවලට ද තුඩු දෙයි. ඇතැමුන් සිතන්නේ මේ පක්ෂ දෙක එකතු වුවහොත් රටේ සියලු ප්‍රශ්න විසඳිය හැකි බවය. ඇතැම් මාක්ස්වාදීන්ට අනුව පක්ෂ දෙකම ධනපති පංතියේ පක්ෂය. මාක්ස්වාදීන් සියලු දෙනාම ඒ සම්බන්ධයෙන් එකඟ නැත. එජා පක්ෂයට වඩා වෙනසක් ශ්‍රී. ල. නි. පක්ෂයේ දකින මාක්ස්වාදීහු ද වෙති. එහෙත් ඒ කුමක් දැයි ඔවුහු නොදනිති. පක්ෂ දෙක අතර වෙනසක් ඇති මුත් ඒ කුමක්දැයි පිළිගත හැකි අයුරින් සංගතව ප්‍රකාශ කිරීමට මාක්ස්වාදයට නොහැකිවීමෙන් පෙන්නුම් කෙරෙන්නේ මාක්ස්වාදයෙහි බංකොලොත්බවය.

අප බොහෝවිට කියා ඇති පරිදි බණ්ඩාරනායක මහතා 1951 දී ශ්‍රී. ල. නි. පක්ෂය ආරම්භ කළේ තවත් ලිබරල් පක්ෂයක් ලෙසය. ඒ පක්ෂය රූපාන්තරකරණයකට ලක්වී ජාතිකත්වයේ පක්ෂයක් බවට පත්වූයේ 1954 අවධියෙහිය. බණ්ඩාරනායක මහතා තමාගේ පරම්පරාවේ (තම වයසේ සමකාලිකයන්ගේ යන අරුතින්) වෙනත් අයගෙන් වෙන්වූයේ ඔවුන්ට වඩා මුහුකුරාගිය ජාතිකත්වයක් බණ්ඩාරනායක මහතා සතුව තිබූ බැවිනි. ඒ ජාතිකත්වය හුදෙක් ඡන්දය ලබාගැනීමේ අරමුණින් ඇතිකරගත් එකක් යැයි පැවසීම ඒ මහතාට කරන නිග්‍රහයක් පමණකි. එහෙත් මෙරට ජාතිකත්වය පිළිබඳ පූර්ණ දැනුමක් එතුමා සතුව තිබිණි යැයිද අපට කිව නොහැකිය. එතුමාගේ පවුල් පසුබිම හා අධ්‍යාපනය හේතුකොටගෙන එවැනි දැනුමක් එතුමාගෙන් බලාපොරොත්තුවීම ද අසාධාරණය. ශ්‍රී.ල.නි. පක්ෂය ආරම්භ කිරීමේ දී එතුමාට තිබුණේ ගතානුගතික හා අධිරාජ්‍යගැති එ.ජා. පක්ෂය වෙනුවට ලිබරල් පක්ෂයක් ඇරඹීමේ අවශ්‍යතාව වුවද යම් ජාතිකත්වයක් එතුමා සතු බව එයට කලින් සිංහල මහා සභාව පිහිටුවීමෙන් පෙනී යයි. ඒ සියල්ල තිබියදී ශ්‍රී.ල.නි. පක්ෂය මෙරට ජාතිකත්වයේ, සිංහලත්වයේ පක්ෂයක් බවට පත්කරන ලද්දේ රටේ මහජනතාව විසිනි. මෙරට වෙන කිසිම පක්ෂයකට නොමැති ලක්ෂණයක් ශ්‍රී.ල.නි පක්ෂය සතුවන්නේ මේ වැදගත් කරුණ හේතුකොටගෙනය. වෙනත් පක්ෂවල මෙන් නොව 1954 පමණ සිට ශ්‍රී.ල.නි. පක්ෂයේ ප්‍රතිපත්ති තීරණය කෙරෙන්නේ ප්‍රධාන වශයෙන්ම සිංහල ජනතාව විසිනි. ඒ ජනතාව ශ්‍රී.ල.නි පක්ෂයේ ඡන්ද පදනමට වඩා වැඩිවූවකි. එකී ජනතාව ශ්‍රී.ල.නි. පක්ෂයේ හදවත හා බද්දය. එජා පක්ෂයට හා වෙනත් පක්ෂවලටද ඡන්ද පදනමක් ඇත. එහෙත් ඒ ඡන්ද පදනම වූ මහජනතාවට ඒ ඒ පක්ෂවල ප්‍රතිපත්ති තීරණය කළ හැකි නොවෙයි. ඒ ඒ පක්ෂයේ මධ්‍යම කාරක සභාව, දේශපාලන මණ්ඩලය හා අවසානයේදී නායකත්වය විසින් ඒ ඒ පක්ෂයේ ප්‍රතිපත්ති කවරේ දැයි තීරණය කෙරෙයි. එහි දී පකෂයේ ඡන්ද පදනම වූ ජනතාවට කළ හැකි කාර්යය අල්පමාත්‍රය. විශේෂයෙන්ම මාක්ස්වාදී පකෂවල මේ ලකෂණය කැපී පෙනෙයි. මාක්ස්වාදී පකෂයක ජනතාවට තබා පකෂ සම්මේලනයටවත් පකෂයේ ප්‍රතිපත්ති තීරණය කිරීමේදී වැදගත් කාර්යභාරයක් හිමි නොවෙයි. ඒ සියල්ල දේශපාලන මණ්ඩලයෙන් හා මධ්‍යම කාරක සභාවෙන් කෙරෙයි. ඡන්ද පදනමේ අවශ්‍යතාව මත ප්‍රතිපත්ති වෙනස්කිරීමට මාක්ස්වාදී පක්ෂයක් නොවෙහෙසෙන්නේ එයට අවශ්‍ය න්‍යායාත්මක දැනුම ජනතාවට නොමැති බැවිනි. පක්ෂයේ ප්‍රතිපත්ති සකස්වෙන්නේ නායකයන්ට තේරෙන මාක්ස්වාදී න්‍යායට අනුවය. ඒ මාක්ස්වාදී න්‍යාය මාක්ස් විද්වතා ඇතුළු වෙනත් බටහිර සංස්කෘතියෙහි බුද්ධිමතුන් විසින් නිර්මාණය කෙරී ඇත. ඒ අර්ථයෙන් ගත්කල මෙරට මාක්ස්වාදී පක්ෂවල ප්‍රතිපත්ති තීරණය කෙරෙන්නේ බටහිරට අවශ්‍ය ආකාරයටය. මාක්ස්වාදීන් එහිදී පවසනු ඇත්තේ මාක්ස්වාදී න්‍යාය වාස්තවික බවත් එය එක් රටකට පමණක් හෝ එක් කලාපයකට පමණක් හෝ සීමා නොවුණු බවත්ය. මේ වාස්තවික බොරුව අප විසින් හෙළිදරව් කෙරී ඇති බැවින් ඒ ගැන තවදුරටත් කරුණු දැක්වීම අනවශ්‍යය.

අවුරුදු හැටකට පෙර එ.ජා. පක්ෂය පිහිටුවනු ලැබුයේ සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මැතිවරණය තරග කිරීමේ බලාපොරොත්තුව පෙරදැරිකරගෙනය. 1946 දී සෝල්බරි ව්‍යවස්ථාව ක්‍රියාත්මක වී නොතිබුණ ද මෙරට ඇතැම් ප්‍රභූහු මැතිවරණයක් සඳහා සූදානම් වූහ. බණ්ඩාරනායක මහතාද තම සිංහල මහා සභාව සමගින් එ.ජා පක්ෂය පිහිටුවීමට දායක විය. එ.ජා. පක්ෂයේ ප්‍රතිපත්ති සකස් වුයේ ඒ පක්ෂයට ඡන්දය දීමට බලාපොරොත්තුවෙන්

© Prof. Nalin De Silva

සිටි ජනයා හෝ පසුකලෙක ඒ පක්ෂයට ඡන්දය දුන් ජනයා හෝ විසින් නොවේ. පක්ෂයේ ප්‍රතිපත්ති සකස් වූයේ නායකත්වයට අවශ්‍ය ආකාරයටය. එදා එහිදී ඩී. එස්. සේනානායක මහතා විශේෂ කාර්යභාරයක් ඉටුකළේය. එහි දී ඒ මහතාට ඔලිවර් ගුණතිලක මහතාගේ පමණක් නොව සෝල්බරි හා අයිවර් ජෙනිංග්ස් මහතුන්ගේත් සහාය ලැබුණාට සැකයක් නැත. අදද එ.ජා.පක්ෂයේ ප්‍රතිපත්ති තීරණය වන්නේ බ්‍රිතාන්‍යයට අවශ්‍ය ආකාරයට බව රහසක් නොවෙයි. මේ දිනවල දෙමළ ජාතිවාදය සම්බන්ධයෙන් පක්ෂ ප්‍රතිපත්ති තීරණය වන්නේ නෝර්වේ රටට අවශ්‍ය ආකාරයට බව පෙනී ගියද, ඒ පිටුපස ඇත්තේ බ්‍රිතාන්‍යයය.

එ.ජා. පක්ෂය අද සහසන්ධීය (කොන්ෆෙඩරේෂන්) ප්‍රතිපත්තියක එල්බගෙන සිටිනු දැකිය හැකිය. මේ ප්‍රතිපත්තියේ නිර්මාතෘවරු බටහිරයෝ වෙති. ඔවුහු රනිල් වික්‍රමසිංහ මහතා ලවා තම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවති. තම ඡන්ද පදනමේ අදහස කුමක් වුවත් එ.ජා. පක්ෂයට ඉන් වැඩක් නැත. ඒ අර්ථයෙන් ගත්කල ඒ.ජා. පක්ෂය මාක්ස්වාදී පක්ෂයක් මෙන්ය. ඒ පක්ෂවලට තම ඡන්ද පදනමට කන්දීමට අවශ්‍ය නැත. ඒ පක්ෂ කරන්නේ හැකිනම් තම ඡන්ද පදනම තම ප්‍රතිපත්තියට ආකර්ෂණය කරගැනීමය. එසේ කළ නොහැකි නම් මාක්ස්වාදී පක්ෂ හෝ එ.ජා. පක්ෂය හෝ ඒ ගැන එතරම් සැලකිලිමත් වන බවක් පෙනෙන්නට නැත. ඊනියා වාස්තවික සත්‍යය ජයගන්නා මොහොතේ තම පක්ෂය ජයගනු ඇතැයි ඒ ඒ පක්ෂය සිතන බව පෙනෙන්නට ඇත. අද එ ජා පක්ෂය මෙන්ම මාක්ස්වාදී පක්ෂද ජනතාව වෙතට නැඹුරුවීමට සිහිනෙන් හෝ උත්සාහ නොකරනු ඇත. ඔවුන්ට අවශ්‍ය තම ඡන්ද පදනම ද තම පක්ෂයේ ප්‍රතිපත්තිය වෙතට හරවාගැනීමටය. එහෙත් ශ්‍රී ල නි පක්ෂය එසේ නොවෙයි. එහි ප්‍රතිපත්ති තීරණය කරනු ලබන්නේ එහි ඡන්ද පදනම මගිනි. මෙය හුදෙක් ඡන්දය ලබාගැනීම් වස් පක්ෂය විසින් කෙරෙන ප්‍රතිපත්ති වෙනසක්ද නොවෙයි. එය පක්ෂයේ සම්ප්‍රදාය වෙයි. ශ්‍රී ල නි පක්ෂය ජාතිකත්වයේ පක්ෂය බවට පත්කරනු ලැබුයේ බණ්ඩාරනායක මහතා විසින් හෝ පක්ෂයේ වෙනත් නායකයකු විසින් හෝ නොව පක්ෂයට බාහිර වූ පුද්ගලයන් විසිනි. බණ්ඩාරනායක මහතා බණ්ඩාරනායක, චෙල්වනායගම් ගිවිසුම ඉරාදැමීම පිළිබඳ විවිධ මත පළවෙයි. එහිදී සිදුවූයේ අත්කිසිවක් නොව ජාතිකත්වයේ ප්‍රතිපත්තියට බණ්ඩාරනායක මහතා නම්මා ගැනීමය. ඒ මහතා අවසානයේදී සිංහලත්වයේ ප්‍රතිපත්තියට එකග විය. ඒ ගිවිසුම ක්‍රියාත්මක වී නම් ඒ ඔස්සේ සන්ධීය රාජ්‍යයක් ඇතිවන බව තේරුම් ගත් භිකෂුන්වහන්සේ හා වෙනත් සිංහල ගිහි නායකයෝ ගිවිසුම ඉරාදැමීමට බණ්ඩාරනායක මහතාට බල කළහ. අද මේ සියලු ප්‍රශ්නවලට හේතුව එදා ඒ ගිවිසුම ඉරාදැමීම යැයි රාජ්‍ය නොවන සංවිධානවල බැලයන්ට කිවහැකිය. එහෙත් යම් හෙයකින් එදා ඒ ගිවිසුම ක්‍රියාත්මක විණි නම් අද ලංකාවෙහි දේශසීමා සටන් දැකිය හැකිව තිබිණි. රාජ්‍ය නොවන සංවිධානවල බැළයන් දන්නා ඉතිහාසයක් හෝ ජාතිකත්වයක් හෝ වේද?

බටහිරයන්ගේ හා රාජ්‍ය නොවන බැළයන්ගේ මෑත අවශ්‍යතාවක් වූයේ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ලවා ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්ති වෙනස්කරවීමය. පක්ෂයේ ඡන්ද පදනම අමතක කර උඩින් පක්ෂ ප්‍රතිපත්ති තමන්ට අවශ්‍ය ආකාරයට වෙනස්කිරීමට විජාතික බල්වේග ක්‍රියා කළ ප්‍රථම අවස්ථාව ඒ නොවීය. එයට කලින් බණ්ඩාරනායක පවුලට විවාහයෙන් සම්බන්ධ වී සිටි කුමාර රූපසිංහ හා විජය කුමාරතුංග ඔස්සේ ඒ කිරීමට විජාතික බලවේග උත්සාහ කළේය. ඒ අවස්ථා දෙකෙහිදීම අවසාන වශයෙන් සිදුවූයේ ඒ දෙදෙනාම පක්ෂයෙන් විසිවීමය. ජේ. ආර් ජයවර්ධන-ආර් ප්‍රේමදාස පීඩනයෙන් දුර්වල වී සිටි ශ්‍රී ල නි පක්ෂය මුළුමනින්ම වෙනස්කිරීමට ඉටාගත් විජාතික බලවේග එවකට එංගලන්තයේ ජීවත් වූ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය මෙරටට ආනයනය කළේය. පක්ෂයේ දුර්වලතා හේතුකොටගෙන එවර තමන්ට රිසිසේ පක්ෂය මෙහෙයවාගත හැකි යැයි විජාතික බලවේග කල්පනා කර ඇත. විජාතික බලවේග ක්‍රමයෙන් තම අරමුණ ඉටුකරගන්නා තැනට ගමන් කළේය. 1994 සිට 2005 පමණ දක්වා වූ කාලය ශ්‍රී ල නි පක්ෂ ඉතිහාසයේ අඳුරුම කාල පරිච්ඡේදය විය. ඒ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය පක්ෂයේ බලවන්තිය වූ කාලයය. ඇගේ නායකත්වය යටතේ පක්ෂයේ ජාතික ප්‍රතිපත්ති මුළුමනින්ම පාහේ වෙනස්කරනු ලැබිණි. එහෙත් සිංහලයන් පරාජය කිරීම ලෙහෙසි පහසු කාර්යයක් නොවෙයි. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ සහායක් නැතිව වුවද මහින්ද රාජපක්ෂ මහතා ජයග්‍රහණය කරවීමට ජාතික බලවේගවලට හැකිවිය. එහිදී ශ්‍රී ල නි පක්ෂයෙ සහායට සිටියේ ජනතා විමුක්ති පෙරමුණ, ජාතික හෙළ උරුමය හා ජාතික සංවිධාන මිස අද ෆෙඩරල් ගැන කතාකරන්නන් නොවේ. කෙසේ හෝ අවසානයේදී සිදුවූයේ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය පක්ෂයේ ප්‍රතිපත්ති වෙනස්කිරීම නොව පක්ෂය කුමාරතුංග මහත්මියගේ නායකත්වය වෙනස් කිරීමය. එ ජා පයේ එවැන්නක් නොසිදුවෙයි. රනිල් වික්‍රමසිංහ මහතා මැතිවරණ දුසිමකටත් වැඩි සංඛ්‍යාවකින් පැරදීත් බටහිරයන් වෙනුවෙන් පක්ෂය

© Prof. Nalin De Silva

මෙහෙයවයි. එහෙත් මහින්ද රාජපක්ෂ මහතාට පක්ෂයටත් රටටත් නායකත්වය දියහැක්කේ ජාතිකත්වය මත රැඳෙමිනි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva